# ආණ්ඩුකාරවරු දෙදෙනෙක් ජනපතිවරණ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනයේ

## ජනපතිවරණයෙන් පසු අධිකරණ ක්‍රියාමාර්ග ගන්නවා


– පැෆරල්

**ඉන්දික හේවාවිතාරණ**


ආණ්ඩුකාරවරුන් දෙදෙනෙකු ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන ආකාරයට කටයුතු කරමින් සිටින බවත්, මෙය ඉතාමත් නරක ක්‍රියාවක් බවත් පැෆරල් සංවිධානය සඳහන් කරයි.

ආණ්ඩුකාරවරුන් දෙදෙනා සිදු කරන මෙම ක්‍රියාවලට හා පළාත් පාලන ආයතනවල දේපළ යොදාගැනීම්වලට එරෙහිව මැතිවරණය අවසන් වූ පසු අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

ආණ්ඩුකාරවරුන් දෙදෙනා රාජ්‍ය සේවයට පත්වීම් ලබාදෙමින් අදාළ අපේක්ෂකයා ප්‍රවර්ධනය වන ආකාරයට කටයුතු කරන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනත සහ මැතිවරණ කොමිසම නිකුත් කළ ගැසට් නිවේදන තුළ ජනාධිපතිවරණයට අදාළ නීතිමය තත්ත්වයන් පැහැදිලිව සඳහන් කර තිබුණද සමහර අපේක්ෂකයන් එය උල්ලංඝනය වන ආකාරයට කටයුතු කරන බවත් ඔහු පවසා සිටියේය.

එක් අපේක්ෂකයෙකු මධ්‍යම රජයේ රාජ්‍ය දේපළ අවභාවිත කරන විට තවත් අපේක්ෂකයෙකු පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල රාජ්‍ය දේපළ අවභාවිත කරන බවද ඒ මහතා සඳහන් කළේය.

කිසිදු රාජ්‍ය දේපළක් දේශපාලන කටයුතුවලට යොදාගත නොහැකි බවට නීති තිබුණද සමහර අපේක්ෂකයන් ප්‍රසිද්ධියේම නීති උල්ලංඝනය කරමින් තිබෙන බවත්, මෙය කනගාටුවට කරුණක් බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා කියා සිටියේය.

2015 වසරේදී මහජන දේපළ අවභාවිත කළ රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනෙකුට නීතිය ක්‍රියාත්මක වූ බවත්, මේ නිසා සෑම රාජ්‍ය නිලධාරියෙකුම මහජන දේපළ දේශපාලනයට යොදාගැනීමට පෙර මේ පිළිබඳ අවධානය යොමුකළ යුතු බවත් හෙතෙම කියා සිටියේය.